# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1893/14 - 2014 දෙසැම්බර් මස 17 වැනි බදාදා - 2014.12.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 9/2011.

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වන වගන්තිය යටතේ වූ නියමය

කලින් කල සංශෝධිත පරිදි 1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමග සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු එකී පනතේ 72 වන වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දාහතරක් වූ දෙසැම්බර් මස 17 වැනි දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මඟින් පවරා දෙමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 දෙසැම්බර් මස 17 වැනි දින,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

**උපලේඛනය**

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු කොට්ඨාසයෙහි කොහොන්සිය පත්තුවේ තැන්නේ පිහිටි පුටුකකුලේ හේන කියන කුරක්කන් සේරු පහලොවක පමණ වපසරියක් ඇති කුමාරසාමි අවසරලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 2974, 25.8.1964 දරන ප්ලෑනේ ප්‍රකාර අක්කර හතරකුත් රූඩ් දෙකකුත් පර්චස් විසිහයක් (අ. 4, රූ. 2, පර්. 26) විශාල ඉඩමෙන් බී. ඇස්. ඒ. කෘෂ්ණ අවසරලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 2971, 27.8.1964 දරන ප්ලෑනේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද බස්නාහිර පැත්තේ දෙකෙන් පංගුව වන ලොට් අංක 1 දරන අක්කර දෙකකුත් රූඩ් එකකුත් පර්චස් දහතුනක් (අ. 2, රූ. 1, පර්. 13) විශාල බිම් වාසියට මායිම්, නැගෙනහිරට එකී අංක 2971 දරන ප්ලෑනේ සඳහන් මෙම ඉඩමේ ලොට් 2 දරන කොටස ද, දකුණට : අලවතුයායේ වත්ත ද, හීනගමුවාගේ වත්ත සහ බාරොන් සිංඤෝගේ වත්ත ද, බස්නාහිරට කැටපිට වත්ත ද, උතුරට මුවගල වත්ත ද, මායිම් වූ බිම් වාසිය සහ ඊට අයිති සියලු දේත් වේ.

මේ ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 252/201 වන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. සබරගමු පළාතේ, කෑගලු දිස්ත්‍රික්කයේ, ගල්බඩ කෝරළේ, තුන්පළාත පත්තුවේ මෝරාගම්මන සහ ගැටබේරියටත් ඇතුළත්ව පිහිටි වේරගලේ හේන වී තුන්පැලේ වපසරිය ද මහලිඳ වත්තේ හේන වී එක පැලකුත් කුරුණි පහක වපසරිය ද වේරගලේ හේන වී දෙපැලක වපසරිය ද යන යාවූ දැනට මහලිඳ වත්ත නමින් ව්‍යවහාර කරන ඉඩමට ඒ. සී. ඇස්. ඩිරැක්ස් බලයලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 1951ක් වූ ජුනි මස 22 වැනි දින මැන සෑදූ අංක 2628 දරන ප්ලෑනේ ප්‍රකාර මායිම්, උතුරට කුඩා ඔය ද, දන්ගෙදර වත්ත සහ කුරුකොහො වත්ත ද, නැගෙනහිරට සියඹලාවත්ත ද, දකුණට අරණායක වත්ත සහ ඇල්හේන ද, බස්නාහිරට ගල්බොක්කේ වත්ත වෙන්වන ගල්බොක්කේ ඇල සහ ගැටබේරි ඇල ද යන මායිම් තුළ අක්කර අටකුත් රූඩ්ස් තුනක් (අ. 8, රූ. 3, පර්. 0) විශාල ඉඩමේ බස්නාහිර පැත්තේ ගැටබේරි ඇලට කිට්ටුවෙන් සාදවා තිබෙන ගඩොල් බැම්මේ රට උළු සෙවිලි ගෙය සහ එම ගෙය තිබෙන හරියෙන් නොබෙදූ අක්කර තුන්කාලක් විශාල බිම් වාසියක් සහ ඊට අයිති සියලු දේත් වේ.

මේ ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 547/84 වන පත්‍ඉරුවේ ලියාපදිංචි වී ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මාම්පේ කැස්බෑව ගම්සභා සීමාව තුළ මාම්පේ යන ගම පිහිටි බටදොඹගහලන්ද නමැති ඉඩමෙන්, කේ. ආර්. බී. පෙරේරා අවසරලත් මිනින්දෝරු තැන විසින් 1960ක් වූ ජනවාරි මස 9 වැනි දින මැන සාදන ලද අංක 264 දරන සිතියමේ ප්‍රකාර බෙදා වෙන් කළ අංක 4 දරන කොටසට මායිම්, උතුරට ප්‍රසිද්ධ පාර ද, නැගෙනහිරට එච්. සී. සයිමන්ට සහ තව අයට අයිති බටදොඹගහලන්ද වත්ත ද, දකුණට අංක 3 දරන කොටස ද, බස්නහිරට අංක 3 දරන කොටස ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහලොවකුත් දශම හතරයි තුන (අ. 0, රූ. 0, පර්. 15.43) ක් විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පළතුරු ආදී සියලු දේද එහි පිහිටි ගෙය ද යන මෙකී දේපල වේ.

මේ ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1770/247 වන පත්‍ඉරුවේ ලියාපදිංචි වී ඇත.

01-140

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.